# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,813 — 1961 දෙසැම්බර් 9 වැනි සෙනසුරාද — 9.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

**18 (1) වෙනි නියෝගය යටතේ වූ ආඥාව**

මෙහි උපලේඛනයෙහි විස්තර කෙරෙන එක් එක් සංවිධානය සම්බන්ධයෙන් ඒ සංවිධානය විසින් හෝ එහි සාමාජිකයන් හෝ පාක්ෂිකයන් විසින් මහජන ආරක්ෂාවට, මහජන සාමය පවත්වා ගැනීමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට හානි කරවූ කාර්යයන් සඳහා නොහොත් 1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 16 වෙනි නියෝගයේ (අ) සිට (ඌ) දක්වා වූ ඡේදවල හෝ 12 වෙනි නියෝගයේ (1) වෙනි ඡේදයේ (ආ) සහ (ඇ) යනු අනුච්ඡේදයන්හි සඳහන් කාර්‍ය කිසිවක් සඳහා ක්‍රියා කිරීමේ නොහොත් ඒ සංවිධානය හෝ එහි සාමාජිකයන් හෝ පාක්ෂිකයන් ප්‍රයෝජනයට ගැනීමේ අන්තරාය ඇතැයි සැහීමට පත්වූයෙන්, අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, ඒ සංවිධානය තහනම් කරනු ලැබූ සංවිධානයක් ලෙස ඒ නියෝගවල 18 වෙනි නියෝගයේ (1) වෙනි ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතලවල ප්‍රකාර මේ ආඥාවෙන් ප්‍රකාශ කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1961 දෙසැම්බර් 9,
කොළඹ.

### උපලේඛනය

සාමාන්‍යයෙන් ලංකා ෆෙඩරල් පක්ෂය යනුවෙන් හැඳින්වෙන පක්ෂය.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2285—ජේ. ඇන්. ආර් 261—7,020 (61/12)